රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

# (SLIDA)

## කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) පුරප්පාඩු පිරවීම

***(පුරප්පාඩු 04 ක් සඳහා ස්ථිර පදනම මත බඳවා ගනු ලැබේ)***

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) යනු ඉගෙනුම් සහ සංවර්ධනය, කළමනාකරණ උපදේශන සේවා හා පර්යේෂණ හරහා ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ධාරිතාව ගොඩ නැංවීම සම්බන්ධයෙන් වගකිව යුතු ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයයි.**

**ආයතනයේ පවතින කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු 04 ක ඇබෑර්තු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්**

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (4)කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය(06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර(උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුන (3)ක් සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර සමත්ව තිබීම.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය -** ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**ලිඛිත තරග විභාගය - විෂය නිර්දේශය**

I. **භාෂා ප්‍රවීණතාව :** මෙහිදී අපේක්ෂකයා සේවයට බැඳීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව පරීක්ෂා කරනු ලැබේ. එහිදී, ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සාමාන්‍ය ව්‍යාකරණ රීති භාවිතය පිළිබඳ අපේක්ෂකයාගේ හැකියාවන් මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

II. **අභියෝගතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම :** තනතුරට පැවරෙන කාර්යයන් මනාව ඉටුකිරීම සඳහා අපේක්ෂකයා තුළ ඇති අභියෝග්‍යතාව සහ කුසලතාවද වර්තමාන තත්ත්වයන් පිළිබඳ ඔහුගේ දැනුම ද පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

III. **පරිගණක පරීක්ෂණය :** තොරතුරු තාක්ෂණයට අදාළ මූලික සංකල්ප හා පරිගණක භාවිතයට අදාළ විවිධ භාවිතාවන් සහ ගොනු කළමනාකරණය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම සහ හැකියාව මැන බැලීම සඳහා වන පරීක්ෂණයකි.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

- බඳවා ගැනීමේ විභාගය සමත් වීම සඳහා අපේක්ෂකයන් විසින් එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40%ක් ද විෂයයන් තුන සඳහා එකතුව අවම වශයෙන් 50%ක් ද ලබා ගත යුතුය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම බාහිර අපේක්ෂකයන් විභාගයේදී ලබා ගත් ලකුණු අනුපිළිවෙල අනුව තීරණය කෙරේ.

**වැටුප් පරිමාණය :** MA 1-1 – 2025 රු.46,220-540×10-630×7-890×4-1190×20-83,390/-

**වයස :** අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

විභාග ගාස්තුව රු. 600/- ක් වන අතර අයදුම්පත් භාර ගැනීම අවසන් වන දිනට (2025.12.26) පෙර එම ගාස්තුව අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය නමින් ලංකා බැංකුවේ, නිදහස් චතුරස්‍ර ශාඛාවේ අංක 92563132 දරණ ගිණුමට  බැර කර, අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපතෙහි විස්තර මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඊට ඇතුළත් යුතු වේ. මුදල් ගෙවීමේ දී ලදුපතෙහි මුදල් ගෙවූ කාරණය NIC No: - **MA2025 (උදා: 96XXXXXXV – MA2025)** ලෙස අනිවාර්යෙන්ම සඳහන් කරන්න. ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ. නියමිත දිනට පසුව ගෙවීම් සිදු කර ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**පොදු කරුණු :**

- සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයනයයේ වෙබ් අඩවිය (**www.slida.lk)** වෙත පිවිස එහි Announcement යටතේ ඇති ගූගල් පෝරමය පුරවා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. (**https://www.slida.lk/announcement** )
- ඉහත සියලු බඳවා ගැනීම් සම්බන්ධ අවසාන තීරණය පාලක මණ්ඩලය සතු වේ.

---


**Director General**
**Sri Lanka Institute of Development Administration**
**28/10 Malalasekara Mawatha**
**Colombo 07**
**Tele : 94 11 5980200  Fax : 94 11 2584406**
**E-mail : slida.lk**